සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | |
|---|---|---|
| නර්තනය (භරත) I<br>நாட்டியம் (பரதம்) I<br>Dancing (Baratha) I | 53 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය, **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** "කුඩ මුලවච්චදි වලියේ අනල් කෛයෙන්දි කුත්තාඩ වල්ල කුලකනාගි ..." යන තේවාරම් ගීතයේ සඳහන් වන දෙවියන් වනුයේ,

(1) ගණ දෙවියන් ය. (2) නඩරාජ දෙවියන් ය.
(3) මහා විෂ්ණු දෙවියන් ය. (4) කතරගම දෙවියන් ය.
(5) භෛරව දෙවියන් ය.

**2.** අස්ථිරකම පෙන්වනු ලබන භාවය වන්නේ,

(1) විභාව වේ. (2) අනුභාව වේ. (3) ස්ථායී භාව වේ.
(4) සන්චාරි භාව වේ. (5) සාත්වික භාව වේ.

**3.** අෂ්ටවිද නායකි අතුරෙන් තම පෙම්වතා නියමිත වේලාවට නොපැමිණීම හේතුවෙන් දුක් විඳින නායිකාව වන්නේ,

(1) විරහෝත් කණ්ඩිතා ය. (2) කලාහාන්තරිතා ය.
(3) ප්‍රෝෂිත බර්තුකා ය. (4) වාසක සජ්ජිතා ය.
(5) අභිසාරිකා ය.

**4.** 'මෝහිනි විලාස කුරවන්ජි' සංස්කෘත භාෂාවෙන් රචිත කතුවරයා වන්නේ,

(1) දෙවෙනි සකෝජි ය. (2) මුත්තු කවිරායර් ය.
(3) තිරි කුඩරාසප්ප කවිරායර් ය. (4) සහාජි ය.
(5) ශබ්ද රිෂි ය.

**5.** යුද්ධය ආරම්භ වන අවස්ථාව සංකේතාත්මකව දැක්වීමට භාවිත කරන නාදය වන්නේ,

(1) මගුඩි නාදය වේ. (2) මනි නාදය වේ.
(3) පරෛයි නාදය වේ. (4) නෛයාණ්ඩිමේල නාදය වේ.
(5) බකමූණ නාදය වේ.

**6.** නඩරාජ දේව රූප දර්ශනයේ කැමති, අකමැති ප්‍රතිචාරය නොදක්වන තත්ත්වය වන්නේ,

(1) එරුක්ක ය. (2) උන්මත්ත මලර් ය. (3) අරුකු ය.
(4) කොණ්ඩ්‍රෛයි මලර් ය. (5) තාළම් මල ය.

**7.** නවසන්දි කෞත්වම් නර්තන අංගයට ඇතුළත් **නොවන** අංගය වන්නේ,

(1) විෂ්ණු ක්‍රාන්තම් ය. (2) සන්ධ්‍යා නිර්තම් ය. (3) තණ්ඩපාදම් ය.
(4) බුජංග ලලිතම් ය. (5) මණ්ඩලම් ය.

[දෙවැනි පිටුව බලන්න

Department of Examinations - Sri Lanka

**8.** දෙවියන්ව යහළුවකු ලෙස සලකා වන්දනාමාන කරන භක්තිය
(1) මධුර භක්තිය වේ. (2) ලාවන්‍ය භක්තිය වේ.
(3) මූර්ත භක්තිය වේ. (4) සාක්කීය භක්තිය වේ.
(5) වාත්සල්‍ය භක්තිය වේ.

**9.** 'මිශ්‍රජාති මට්ටියතාලය සංකීර්ණ කදී' පෙන්නුම් කිරීමේ දී භාවිත කරන සංඛ්‍යාව වන්නේ,
(1) 48 කි. (2) 64 කි. (3) 84 කි. (4) 108 කි. (5) 144 කි.

**10.** උඩරට නර්තනයේ උරග චලන විදහා දැක්වෙන වන්නම වන්නේ,
(1) ෛවෙරෝඩි ය. (2) සැවුලා ය. (3) ෙනෙයියඩි ය.
(4) අසදෘෂ ය. (5) ඊරඩි ය.

**11.** ග්‍රාමීය කලාවක් වන වාසප්පු කුත්තු පවතින ප්‍රදේශය වන්නේ,
(1) මඩකලපුව වේ. (2) මන්නාරම වේ. (3) කඳුරට වේ.
(4) යාපනය වේ. (5) මුලතිව් වේ.

**12.** විජයනගරයේ කුමාරයා වන කුමාර් කම්බනන් විසින් නර්තන කාන්තාවන්ට අනුග්‍රහය දැක්වූ බව සඳහන් වන්නේ,
(1) වාල්මිකී චරිත්‍රම්හි ය. (2) චතුර්තණ්ඩි ප්‍රකාශිකාහි ය.
(3) රාජ ගෝපාල විලාසම්හි ය. (4) උෂාපරිනයම්හි ය.
(5) මධුරා විජයම්හි ය.

**13.** 'ලුටිතම් ලෝලිතම්' යන චාරිබේදයෙන් උපයෝගී කරගන්නා අඩව්ව වන්නේ,
(1) පළවෙනි මණ්ඩි අඩව්ව ය. (2) පළවෙනි තත්තෙයිතාම් අඩව්ව ය.
(3) දෙවෙනි කුදිත්තු මෙට්ට අඩව්ව ය. (4) තුන්වෙනි තාතෙයිතෙයිතත් අඩව්ව ය.
(5) පස්වෙනි නාට් අඩව්ව ය.

**14.** ස්වාමි විපුලානන්නද කලායතනය ආරම්භ කරනු ලැබුවේ,
(1) සෙල්ලෙයා රාසතුරෙයි විසින් ය. (2) ස්වාමි විපුලානන්දර් විසින් ය.
(3) සර්. පොන්.රාමනාතන් විසින් ය. (4) සු. නඩේසපිල්ලෙ විසින් ය.
(5) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි විසින් ය.

**15.** කුමාරසාමි නට්ටුවනාර්ගේ වැඩිමහල් පුතණුවන් වන්නේ,
(1) සුප්පරාය නට්ටුවනාර් ය. (2) කන්දප්ප නට්ටුවනාර් ය.
(3) අරුනාචල නට්ටුවනාර් ය. (4) ගංගෙයිමුත්තු නට්ටුවනාර් ය.
(5) ක්‍රිෂ්ණා නට්ටුවනාර් ය.

**16.** නාට්‍ය ශාස්ත්‍රයෙහි නාට්‍ය සාර්ථක වීමට අදාළ කරුණු සඳහන් වන්නේ,
(1) හයවෙනි පරිච්ඡේදයේ ය. (2) දහවෙනි පරිච්ඡේදයේ ය.
(3) විසිවෙනි පරිච්ඡේදයේ ය. (4) විසිහත්වෙනි පරිච්ඡේදයේ ය.
(5) තිස්වෙනි පරිච්ඡේදයේ ය.

**17.** සංග යුගයේ නර්තනයෙහි 'ඌණ්ඩාට්ටු' යන නර්තන ප්‍රභේදය පිළිබඳ සඳහන් කරන ග්‍රන්ථය වන්නේ,
(1) පට්ටිනප්පාලෙ ය. (2) සිරුපාණාටෘප්පඩෛ ය. (3) තොල්කාප්පියම් ය.
(4) මධුරෙයික්කාන්චි ය. (5) කුරුන්තොගෛ ය.

**18.** 'බොම්මලාට්ටම්හි' අත් මෙස් භාවිතයෙන් රූකඩ නටවන ක්‍රමය භාවිත කරන ප්‍රදේශ වන්නේ,
(1) ආන්ද්‍රා සහ කේරලා ය. (2) ඔරිසා සහ බෙංගාල ය.
(3) උත්තර ප්‍රදේශ සහ තමිල්නාඩු ය. (4) බැංගලූර් සහ මහා රාෂ්ඨ ය.
(5) උත්තර ප්‍රදේශ සහ කේරලා ය.

**19.** තාල අංගවලින් '◡' මගින් සංකේතවත් කරනුයේ,
(1) ලඝු ය. (2) අනුතෘදම් ය. (3) තෘතම් ය. (4) කාකපාදම් ය. (5) ප්ලුතම් ය.

[තුන්වැනි පිටුව බලන්න

Department of Examinations - Sri Lanka

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**20.** උඩරට නර්තනයේ ඇතුළත් ශුද්ධ නිරුත අංගවලින් එකක් වන්නේ,
(1) යක්හැනුම ය. (2) යක්කම ය. (3) ආවැන්දුම ය.
(4) ගුරුගෙමාලාව ය. (5) තුණුමාලක්පුව ය.

**21.** සංගමරු යුගයේ දී එකොළොස් වාර්ගික නර්තන අතරින් කාමන් විසින් නර්තනය කරනු ලැබුවේ,
(1) මරක්කාල් ය. (2) කුඩමාඩල් ය. (3) අල්ලියම් ය. (4) පේඩි ය. (5) පාවෛ ය.

**22.** හාස්‍ය රසයට අදාළ රාග පමණක් අන්තර්ගත කාණ්ඩය කුමක් ද?
(1) නාදනාමකිරියෛ සහ සාමා (2) මෝහනම් සහ කේතාරම්
(3) ආහිරි සහ පුන්නාකවරාළි (4) කානඩා සහ මෝහනම්
(5) ආරපඩි සහ කේතාරම්

**23.** පෙම්වතා ගැන සඳහන් කරන විට ඔහුගේ හැඟීම්වල ඇතිවන 'සම්පෝක ශෘංගාර' ක්‍රියාව වන්නේ,
(1) මොට්ටායිතම් ලෙස ය. (2) සිලාස ලෙස ය. (3) කුට්ටමිතම් ලෙස ය.
(4) ලීලා ලෙස ය. (5) විප්ප්‍රකම් ලෙස ය.

**24.** චෝල යුගයේ නර්තන සම්ප්‍රදායේ 'මාරායන්' යනුවෙන් හැඳින්වූයේ,
(1) තළියිලාර් ය. (2) තලෛකෝළිගල් ය. (3) පදියිලාර් ය.
(4) තලිච්චේරි කාන්තාවන් ය. (5) නට්ටුවනාර් ය.

**25.** තරිකිටතොම්, කිටතක තරිකිටතොම්, තක්කිටතකතරිකිටතොම්, කිටතක තරිකිටතොම් සහ තරිකිටතොම් යන අවසාන තීර්මාණය නිර්මාණ වන අම්ප්පු වන්නේ,
(1) මුරුතංගම් ය. (2) කොපුච්ච ය. (3) ස්රොතෝවක ය.
(4) ඩමරුක ය. (5) විසම ය.

**26.** තම නායකයා සමඟ කෝපයට පත්වී සිටින නායිකා සමාදාන කිරීමෙහි සමත් දූතයා වන්නේ,
(1) විඩන් ය. (2) සඟා ය. (3) පීඩමර්ත්තන් ය.
(4) විදූෂකන් ය. (5) සේඩන් ය.

**27.** "තෙරුවිල් වාරානෝ එන්නෛ සට්ටේ තිරුම්බි පාරානෝ ..." යන්න
(1) කීර්තනම් ය. (2) පදම් ය. (3) පදවර්ණම් ය.
(4) අෂ්ඨපති ය. (5) ජාවලි ය.

**28.** 'තකදිමි තකදිමි තකදිමි තකතකිටතදිගි නතොම්තදීං/ගිනතොම්ත තිංගි/තොම්// මෙහි සඳහන් තාල අංගවලට තදිගිනතොම් පිහිටා ඇති ජාදිය වන්නේ,
(1) තිස්ර වේ. (2) චතුස්ර වේ. (3) සංකීර්ණ වේ.
(4) කණ්ඩ වේ. (5) මිස්ර වේ.

**29.** තාලදසප්‍රාණහි ඇතුළත් 'ෂට්' මාර්ගයෙන් සඳහන් කරනු ලබන්නේ,
(1) තුන වේ. (2) හතර වේ. (3) හය වේ. (4) හත වේ. (5) නවය වේ.

**30.** නාට්‍ය වේදිකා වර්ගවල විකිරුදම්හි හැඩය වන්නේ,
(1) ත්‍රිකෝණාකාර ය. (2) චතුරස්‍රාකාර ය. (3) වෘත්තාකාර ය.
(4) ඉලිප්සාකාර ය. (5) ඍජුකෝණාස්‍රාකාර ය.

**31.** තංජවූර් බ්‍රෘහීදෂ්වරර් දේවාලයේ රාජමෝහිනි යන චරිතය පුරා හත් වසරක් අඛණ්ඩව නර්තනය කරනු ලැබුවේ,
(1) පන්දනෛ නල්ලූර් මීනාක්ෂි සුන්දරම් පිල්ලෛ ය.
(2) තන්ජාවූර් සුප්පරාය නට්ටුවනාර් ය.
(3) පන්දනෛ නල්ලූර් සපාරංජිතම් ය.
(4) අභිනය අරසි බාලසරස්වතී ය.
(5) කලෛමාමණී ශ්‍රීමති රුක්මණී අරුන්ඩේල් ය.

Department of Examinations - Sri Lanka

**32.** වීර රසයෙහි ධර්ම වීරයා සඳහා උදාහරණ වශයෙන් පෙන්වාදිය හැකි නායකයා වන්නේ,
(1) ශ්‍රී රාමා ය. (2) සිද්ධාර්ථ ය. (3) අර්ජුනන් ය.
(4) සිහි චක්‍රවර්තී ය. (5) කර්නන් ය.

**33.** භරත නැටුම්වල වස්ත්‍ර තෝරාගැනීමේ දී සැලකිය යුතු කරුණ වන්නේ,
(1) ඇස නිලංකාර වන පරිදි බෝඩර් සහ පාට (ෂරිගෙ) තේරීමයි.
(2) කලු ශරීර වර්ණය ඇති අයට තද වර්ණය තේරීමයි.
(3) වේදිකාවේ පිටුපස තිරයට ගැළපෙන වර්ණය තේරීමයි.
(4) වයස, වර්ණය සහ උස අනුව තෝරා ගැනීමයි.
(5) පැහැපත් සමේ වර්ණයක් ඇති අයට පැහැපත් වර්ණය තෝරා ගැනීමයි.

**34.** ශ්‍රී ලංකාවේ ජනාධිපති විසින් 'කලාකීර්ති' යන ගෞරව සම්මානයෙන් පිදුම් ලද යාපනයේ භාරත නැටුම් ශිල්පිනිය
(1) ඥාණා කුලේන්ද්‍රන් ය.
(2) ශාන්තිනි ශිවනේශන් ය.
(3) ක්‍රිෂාණ්ති රවීන්ද්‍රා ය.
(4) යසෝදරා විවේකානන්දා ය.
(5) පද්මිණි සෙල්වේන්ද්‍ර කුමාර් ය.

**35.** චෝල යුගයට අයත් තිරුවෙන්කාඩු සුවෙතාරණ්යේසුවරම්කි සෙල්ලිපියේ සඳහන් වන නර්තන වර්ගය වන්නේ,
(1) අගමාර්ක්ක නට්ටුවම් ය.
(2) සාන්තික්කුත්තු ය.
(3) අභිනයක්කුත්තු නාඩගම් ය.
(4) සොක්කම් ය.
(5) වෛකරෛයි නැටුම් ය.

**36.** භයානක රසයේ අනුභාව පමණක් ඇතුළත් කාණ්ඩය
(1) වීරභාවය, දැත්දෙපා වෙව්ලීම සහ සැඟවීම ය.
(2) කෝපය, වංචාව සහ ඇස් විශාල කර බැලීම ය.
(3) දැත්දෙපා වෙව්ලීම, සැඟවීම සහ වැහැරීම ය.
(4) කඳුළු සැලීම, සැඟවීම සහ වංචාව ය.
(5) තොල් හැපීම, ඇස් විශාල කර බැලීම සහ වංචාව ය.

**37.** නායිකාවට ඇයගේ නායකයා පිළිබඳ අවස්ථාවට උචිත ලෙස කතාකර විනෝද වන කාන්තාව වන්නේ,
(1) පිරාදි වේසිනි ය. (2) සිල්පිනි ය. (3) සේඩි ය. (4) සගී ය. (5) දූදි ය.

**38.** කාන්තාවන්ගේ 'සිපිතාංගා, ස්පුකිතාංගා' යන ලාස්‍ය අංග ඇතුළත් ශාස්ත්‍රීය නර්තනය වන්නේ,
(1) ඔඩිසි ය. (2) මොහිනියාට්ටම් ය. (3) කතකලි ය.
(4) මණිපුරි ය. (5) කතක් ය.

**39.** සිදම්බරම්හි 'පෙරම්පලම්' නමින් හඳුන්වන සභාව වන්නේ,
(1) තිරුත සභාව ය. (2) දේව සභාව ය. (3) රාජ සභාව ය.
(4) කනක සභාව ය. (5) සිට් සභාව ය.

**40.** "ජෙය ගෞරි මණාලා දයාළා ..." යන්නෙන් ආරම්භ වන කීර්තනය ගායනා කරනු ලැබුවේ,
(1) ආචාර්ය ආනන්ද කුමාරසාමි විසිනි.
(2) නවාලියූර් සෝමසුන්දරප්පුලවර් විසිනි.
(3) ඌතුක්කාඩු වෙංකඩසුප්පෙයර් විසිනි.
(4) කනම් ක්‍රිෂ්ණෛයර් විසිනි.
(5) බ්‍රහ්මශ්‍රී න. වීරමනි අයියර් විසිනි.

[පස්වැනි පිටුව බලන්න

Department of Examinations - Sri Lanka
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



- ප්‍රශ්න අංක **41** සිට **45** දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

| අභිනය | වෙනත් නම් | ක්‍රියාව | කොටස | අනු කොටස් |
|---|---|---|---|---|
| ආංගික | සාධි | ශරීර අංග තුළින් ප්‍රකාශ කිරීමයි. | i. සූසිකා අභිනය<br>ii. භාවා අභිනය<br>iii. තොන්ද අභිනය<br>iv. ලක්ෂණිකා අභිනය | **A** |
| **B** | සංචායි | වචනවලින් ප්‍රකාශ කරනු ලබන්නකි. | i. සුකීත වාචික<br>ii. උපගීත වාචික<br>iii. සුසබද්ද වාචික<br>iv උපසබ්බත වාචික | i. ආදි භාෂාව<br>ii. ආර්ය භාෂාව<br>iii. ජාති භාෂාව<br>iv යුත්යන්තිරි භාෂාව |
| ආහාර්ය | **C** | අලංකාර කිරීම සඳහා භාවිත කරන අලංකාරවලින් ප්‍රකාශ කරනු ලබන්නකි. | **D** | i. පුෂ්ඨ<br>ii. අලංකාර<br>iii. අංගරචන<br>iv සංජීව |
| සාත්වික | විපසායි | **E** | i. සාටිසුෂීය<br>ii. වියංජික | i. ස්තම්බ<br>ii. ප්‍රලය<br>iii. රෝමාණ්ච<br>iv ස්වේත |

**41.** **A** හි සඳහන් විය යුතු අභිනයහි අනුකොටස් වන්නේ,

(1) සුත්ත, අසුත්ත සහ අදියන්තය ය.
(2) අංග, උපාංග සහ ප්‍රත්‍යංග ය.
(3) පුෂ්ඨ, අලංකාර සහ අංග රචනා ය.
(4) අංග, පුෂ්ඨ සහ අසුත්ත ය.
(5) ප්‍රත්‍යංග, පුෂ්ඨ සහ අලංකාර ය.

**42.** **B** හි සඳහන් විය යුතු අභිනය වන්නේ,

(1) ආංගික වේ. (2) භාවික වේ. (3) නිජාකාර්ය වේ.
(4) ආවාක්‍ය වේ. (5) වාචික වේ.

**43.** **C** හි සඳහන් විය යුතු අභිනයෙහි වෙනත් නමක් වනුයේ,

(1) ස්ථායි ය. (2) වියපිචාරී ය. (3) අනුචායී ය.
(4) සංචායී ය. (5) සායී ය.

**44.** **D** හි සඳහන් විය යුතු අභිනයෙහි කොටස වනුයේ,

(1) සූචිකා, සුකීත සහ ස්තම්බ ය.
(2) අස්රු, වෛස්වර්ය හ ස්වේත ය.
(3) අභිසාරී, ප්‍රලය සහ රොමාන්ජම් ය.
(4) නිජාකාර්ය, අහිරී සහ ව්‍යාසායි ය.
(5) ව්‍යාසායි, අස්රු සහ ස්වේත ය.


**45.** **E** හි සඳහන් විය යුතු අභිනයේ ක්‍රියාව වනුයේ,

(1) ශරීර අංග තුළින් ප්‍රකාශ කිරීමයි.
(2) ශරීර අංග සහ වචන තුළින් ප්‍රකාශ කිරීමයි.
(3) සාත්වික හැඟීම් තුළින් ප්‍රකාශ කිරීමයි.
(4) අලංකාර තුළින් ප්‍රකාශ කිරීමයි.
(5) වචන තුළින් සහ සාත්වික හැඟීම් තුළින් ප්‍රකාශ කිරීමයි.

Department of Examinations - Sri Lanka

**46.** මෙම රූපයේ දැක්වෙන සංගීත භාණ්ඩයේ නම කුමක් ද?

(1) තාලම් (2) සේමක්කලම්
(3) සල්ලාරි (4) උඩක්කිය
(5) තප්පු




**47.** මෙම රූපයේ දැක්වෙන නර්තන ශිල්පියා කවුද?

(1) බ්‍රහ්මශ්‍රී වීරමණි අයියර්
(2) ගීතාංජලී වී.කේ. නල්ලෛයා
(3) කේ. තොම්මක්කුට්ටි මහතා
(4) එන්. රාසරත්නම් මහතා
(5) කලෛයිවෙල්වන් ඒරම්බු සුප්පයියා



**48.** මෙම රූප සටහනේ සඳහන් භරත නාට්‍ය ආභරණ පිළිවෙළින්,

(1) සූර්ය සහ අඩසඳ වේ.
(2) ජිමිකි සහ කාදුමාට්ටි වේ.
(3) නත්තු සහ කාදුමාට්ටි වේ.
(4) රාකොඩි සහ ජිමිකි වේ.
(5) උච්චිවරි සහ කාදුමාට්ටි වේ.



**49.** මෙම රූප සටහනේ දැක්වෙන ශාස්ත්‍රීය නර්තනය කුමක් ද?

(1) කතකලි
(2) ඔඩිසි
(3) කුච්චිපුඩි
(4) මණිපුරි
(5) මෝහිනියාට්ටම්



**50.** මෙම රූපයෙන් දැක්වෙන ගැමි නර්තනය කුමක් ද?

(1) කරගාට්ටම් ය.
(2) කාවඩියාට්ටම් ය.
(3) කෝලාට්ටම් ය.
(4) බොම්මලාට්ටම් ය.
(5) ඔයිලාට්ටම් ය.



* * *

Department of Examinations - Sri Lanka

PAST PAPERS WIKI

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

නර්තනය (භරත) II
நாட்டியம் (பரதம்) II
Dancing (Baratha) II

53 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* I කොටසේ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **දෙකක්** ද II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** ඔබ ඉගෙන ගත් පදවර්ණම්හි,

(i) රාගය සහ තාලය සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ii) ගී පද රචකයාගේ සහ නැටුම් නිර්මාණ ශිල්පියාගේ නම් සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(iii) දෙවෙනි චරන ස්වර කෝර්වෙහි තාල අංග සංකේත සමග ලියන්න. (ලකුණු 06යි.)

(iv) දෙවෙනි තීර්මාණම්හි තාල අංග සංකේත සමග ලියන්න. (ලකුණු 10යි.)

**2.** යක්ෂගානම්හි,

(i) බිහිවීම සහ වර්ධනය පිළිබඳව කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04යි.)

(ii) සහාය වාදනය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 02යි.)

(iii) නර්තන විධි විස්තර කරන්න. (ලකුණු 06යි.)

(iv) අංග රචනය පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 08යි.)

**3.** ශෘංගාරනායකිහි,

(i) ස්වීයා නායකී ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 02යි.)

(ii) පරකීයානායකීහි ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 02යි.)

(iii) ස්වීයා නායකීහි වර්ග එකිනෙකට වෙන් වෙන් ව විස්තර කරන්න. (ලකුණු 08යි.)

(iv) පරකීයා නායකීහි වර්ග එකිනෙකට වෙන් වෙන් ව විස්තර කරන්න. (ලකුණු 08යි.)

## II කොටස

**4.** (i) ඔයිල්ලාට්ටම් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 06යි.)

(ii) කුදිරෙයියාට්ටම් නර්තනයෙහි නර්තන ක්‍රමය විස්තර කරන්න. (ලකුණු 07යි.)

(iii) බොම්මලාට්ටම්හි වර්ග සඳහන් කර තනි තනිව සවිස්තරාත්මකව විස්තර කරන්න. (ලකුණු 07යි.)

[ දෙවැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka

**5.** (i) 'රාජගෝපාල විලාසම්' යන ග්‍රන්ථයෙහි සඳහන්වන රාජසභා නර්තන ශිල්පීන් **හතරදෙනෙකුගේ** නම් සහ ඔවුන් ඉදිරිපත් කරන ලද නර්තන අංග දක්වන්න. (ලකුණු 04යි.)

(ii) විජයනගර නායක කාලයේ සඳහන් වන නර්තන ශිල්පීන් වර්ග **දෙක** නම් කර, ඒ කාලසීමාව තුළ වාසය කළ පුද්ගලයන්ගේ ජීවිතය හා නර්තනය තුළ තිබූ සම්බන්ධතාව විස්තර කරන්න. (ලකුණු 08යි.)

(iii) ඉංග්‍රීසීන්ගේ කාලය තුළ නර්තන කලාවේ පසුබෑම සඳහා බලපෑ කරුණු විස්තර කරන්න. (ලකුණු 08යි.)

**6.** පහත සඳහන් කරුණු පිළිබඳව කෙටි සටහන් ලියා දක්වන්න.

(i) වීර රස

(ii) වීණා

(iii) කෝලම

(iv) අලාරිප්පු (ලකුණු 05×4=20යි.)

**7.** බ්‍රහ්ම ශ්‍රී.න.වීරමණී අයියර්තුමා විසින් සංගීතය සහ නර්තනයේ වර්ධනය සඳහා ලබාදුන් දායකත්වය සවිස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

**8.** (i) ගුරුකුල නර්තනය සහ වර්තමාන නර්තන අධ්‍යාපන ක්‍රමයේ වෙනස්කම් පිළිබඳව සන්සන්දනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) "නර්තනයේ පැවැත්ම සඳහා ප්‍රායෝගික පුහුණුව අවශ්‍ය වේ." මෙම ප්‍රකාශයේ යෝග්‍යතාවය පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

* * *

Department of Examinations - Sri Lanka


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

LOL Book Store

# 25% OFF ALL BOOKS

**Including Exercise Books, CR Books, and B5 Books**



**ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්**

## ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 WWW.LOL.LK

071 777 4440 (WhatsApp)

**Cash On Delivery Available**

# ORDER GCE A/L SHORT NOTES, MODEL, REVISION BOOKS & PAST PAPERS IN SINHALA, ENGLISH & TAMIL MEDIUM



## LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

WHATSAPP - 0717774440

WEBSITE: WWW.LOL.LK



## GET READY FOR YOUR A/Ls WITH LOL BOOK STORE!